# ආගමන සමයේ නුවානය
# දෙසැම්බර් 18

**පළමුවන කියවීම** — **ජෙරමියා 23: 5–8**

ජෙරමියා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*මම දාවිත්ගේ පෙළපතින් දැහැමි රජ කෙනකු නැගිටුවන්නෙමි.*

ස්වාමින් වන මම මෙසේ වදාරමි. "දාවිත්ගේ පෙළපතින් දැහැමි රජ කෙනෙකු නැගී එන කාලය පැමිණෙන්නේ ය. එතුමාණන් නැණ නුවණින් රජකම් කරමින්, දැහැමිකමත් යුක්තියත් දේශය මුළුල්ලේ ඉටු කරනු ඇත. එතුමන්ගේ රජ දවස ජුදා ගළවවනු ලබන්නෝය. ඉශ්රායෙල්වරු සුරැකිව වසන්නෝය. 'අපේ දැහැමිතාව' යන්නෙන් එතුමා නම් කරනු ලබන්නාහ." ස්වාමින් වන මම මෙසේ වදාරන්නෙමි. "ඉශ්රායෙල් සෙනග මිසර දේශයෙන් ගෙනා ජීවමාන සමිඳාණන් වහන්සේ නමින් අපි දිවුරමු"යි නොකියන කාලය පැමිණෙන්නේ ය. ඒ වෙනුවට 'ඉශ්රායෙල් සෙනග උතුරු දේශයෙන් ද ඔවුන් පන්නා දමනු ලැබූ සියලු දේශවලින් ද ගෙනා සමිඳාණන් වහන්සේගේ නමින් අපි දිවුරමු' යි කියන කාලය පැමිණෙන්නේය. ඔව්හු තමන්ගේ ම දේශයේ වාසය කරන්නෝ ය."

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 72: 1, 2, 12, 13, 18, 19 |
|---|---|

පිළිතුර: සමිඳාණන් සමයෙහි යුක්තිය ඉටු වී සදා පූර්ණත්වයට පත් වේවා.

ගීය: දෙවිඳුනි, රජතුමාට විනිශ්චය කිරීමේ ඥානය දුන මැනව.
ඒ රජ කුමරු හට යුක්තිගරුකව ක්‍රියා කිරීමේ හැකියාව දුන මැනව.
එවිට එතුමා ඔබේ ජනතාව සාධාරණ ලෙස පාලනය කරන්නේ ය.
ඔබේ පීඩිත ජනතාවට යුක්තිය ඉටු කරන්නේ ය.

එතුමා සහන පතා මොරගසන අසරණයන් මුදා ගන්නේය.
පිහිට නැති පීඩිතයන් ද නිදහස් කර ගන්නේය.
එතුමා දුගී දුප්පතුන්ට හා දුබලුන්ට අනුකම්පා කරන්නේය.
දිළිඳුන්ගේ ජීවිත මුදා ගන්නේය.

ඉශ්රායෙල්වරුන් ගේ දෙවිඳුන් හට, දෙවි සමිඳුන් හට පැසසුම් වේවා!
අරුම පුදුම දේ කරන්නේ එතුමාණෝ පමණක් ය.
එතුමන්ගේ ශ්‍රී නාමයට සදා පැසසුම් වේවා!
එතුමන්ගේ මහිමය ලොව පුරා පැතිරේවා!
එසේම වේවා! එසේම වේවා!

## සුසුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සීනයි කන්ද මත මෝසෙස් හට අණ පණත් දුන් ඉශ්රායෙල් ජනතාවගේ පාලකයාණෙනි, වැඩමකර, ඔබවහන්සේගේ ඉමහත් බලයෙන් අප ගළවා ගත මැනව.
ආලේලූයා!

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*දාවිත් පරපුරේ පුත්‍රයෙකු වන ජෝසෙප් හට විවා බස් දී සිටි මරියාවන්ගෙන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උපන් සේක.*

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදු වූයේ මෙසේ ය. උන්වහන්සේගේ මෑණියන් වූ මරියතුමී ජෝසෙප් හා විවාහ ගිවිසගෙන සිටිය දී, ඔවුන් එක්වන්න පෙර, ශුද්ධාත්මයාණන් අනුහසින් ඇ ගැබ්ගෙන සිටින බව දැනගන්නා ලදි.

ඇගේ ස්වාමි පුරුෂයා වන ජෝසෙප්, සත්පුරුෂයෙකු වූ බැවින් ඇය ප්‍රසිද්ධියේ නින්දාවට නොපමුණුවන අදහසින් රහසින් ඇය අත්හැර දමන්නට සිතා ගත්තේ ය. එහෙත් ඔහු මේ කාරණය ගැන කල්පනා කරමින් සිටිය දී ස්වාමින් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ඔහුට දර්ශනය වී, “දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවා ගන්නට බිය නොවන්න. මන්ද, ඇ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි. ඇ පුතෙකු බිහි කරන්නීය. උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතුය. මන්ද, සිය සෙනග ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය”යි කීය. මේ සියල්ල සිදුවූයේ ස්වාමින් වහන්සේ දිවැසිවරයා ලවා කියෙවූ කීම ඉටු වන පිණිස ය. එනම්, “මෙන්න කන්‍යාවක් ගැබ් ගෙන පුතෙකු බිහි කරන්නීය. උන්වහන්සේට ‘එම්මානුවෙල්’ යන නාමය තබනු ඇත’ යනුය. ඒ නාමයේ අර්ථය නම් “දෙවියන් වහන්සේ අප සමග ය” යනුයි. ජෝසෙප් නින්දෙන් අවදි වූ විට ස්වාමින් වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස සිය බිරිඳ කැන්දාගෙන ගියේය. එහෙත් ඇයට පුත්‍රයා ලැබෙන තුරු ඔහු ඇය සමග සහවාසයේ නොයෙදිනි. ඔහු උන්වහන්සේට ජේසුස් යන නාමය තැබීය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*